# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# 2017

## විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය

# දැක්ම

"ජාතියේ බලශක්ති සුරක්ෂිතතාවය තහවුරු කිරිම"

# මෙහෙවර

" ජාතික ආර්ථික සෞභාග්‍යය උදෙසා අවැසි ගුණාත්මක, විශ්වසනීය, තිරසාර හා මිල දැරිය හැකි බලශක්ති සැපයුමක් සහතික කිරිම."

# පටුන


පිටු අංකය

01. අමාත්‍යාංශය පිළිබඳ හැඳින්වීම 4

02. විදුලිබල හා බලශක්ති අංශය 7

03. සැලසුම් අංශය 10

04. සංවර්ධන අංශය 13

05. තාක්ෂණ අංශය 17

06. ටෙන්ඩර් අංශය 19

07. පාලන අංශය 24

08. ගිණුම් අංශය 37

09. අභ්‍යන්තර විගණන අංශය 39

වගු

2.1 භූමිය අත්පත්කරගැනීම - ලංවිම ක්‍රියාකාරකම්
4.1 ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති
6.1 කාර්යසාධනයේ සාරාංශය - ටෙන්ඩර් අංශය
6.2 2017 වර්ෂයේ ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ
7.1 විදේශීය පුහුණු
7.2 දේශීය පුහුණු
7.3 කාර්ය මණ්ඩල වෙනස්වීම් පිළිබඳ තොරතුරු
7.4 කාර්ය මණ්ඩල වෙනස්වීම් පිළිබඳ තොරතුරු
7.5 කාර්ය මණ්ඩල වෙනස්වීම් පිළිබඳ තොරතුරු
7.6 කාර්ය මණ්ඩල වෙනස්වීම් පිළිබඳ තොරතුරු
7.7 කාර්ය මණ්ඩල තොරතුරු
8.1 කාර්යසාධනයේ සාරාංශය - ගිණුම් අංශය
8.2 කාර්යසාධනයේ සාරාංශය - ගිණුම් අංශය
8.3 කාර්යසාධනයේ සාරාංශය - ගිණුම් අංශය
9.1 කාර්යසාධනයේ සාරාංශය - අභ්‍යන්තර විගණන අංශය

ඇමුණුම්

ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් (ඩී.ජී.එස්.ඒ.3) 01
ව්‍යාපෘති අනුව පුනරාවර්තන වියදම් (ඩී.ජී.එස්.ඒ.3/1) 02
ව්‍යාපෘති අනුව මූලධන වියදම් (ඩී.ජී.එස්.ඒ. - 4) 03
ව්‍යාපෘති අනුව මූලධන වියදම් (ඩී.ජී.එස්.ඒ. 4/1) 04
ව්‍යාපෘති අනුව මූලධන වියදම් (ඩී.ජී.එස්.ඒ. 4/2) 05
ව්‍යාපෘති අනුව මූලධන වියදම් (ඩී.ජී.එස්.ඒ. 4/3) 06
ව්‍යාපෘති අනුව මූලධන වියදම් (ඩී.ජී.එස්.ඒ. 4/4) 07
ව්‍යාපෘති අනුව මූලධන වියදම් (ඩී.ජී.එස්.ඒ. 4/5) 08
ව්‍යාපෘති අනුව මූලධන වියදම් (ඩී.ජී.එස්.ඒ. 4/5 i) 08 i

# 01. අමාත්‍යාංශය පිළිබඳ හැඳින්වීම

2015/09/21 දිනැති අංක 1933/13 දරන අතිවිශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව, පහත දැක්වෙන කාර්යයන් සහ කර්තව්‍යන් මෙම අමාත්‍යාංශය වෙත පැවරී තිබේ.

## කාර්යයන් සහ කර්තව්‍යන්

1. විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති විෂයයන්ට සහ අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන්හි විෂයයන්ට අදාළ ප්‍රතිපත්ති, වැඩසටහන් සහ ව්‍යාපෘති සම්පාදනය කිරීම, පසු විපරම් කිරීම හා ඇගයීම.
2. විදුලිබල සම්පත් පාලනය, නියාමනය හා උපයෝගීකරණය උදෙසා උචිත විදුලිබල ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීම.
3. ජලය, තාපය, ගල් අඟුරු සහ සුළං යන මූලාශ්‍රයන් මඟින් විදුලි බලශක්තිය නිපදවීම සම්බන්ධ කටයුතු ගවේෂණය, සැලසුම්කරණය, අධීක්ෂණය සහ සංවර්ධනය.
4. ග්‍රාමීය විද්‍යුතනය.
5. බලශක්ති කාර්යක්ෂමතාව ඇතිවන පරිදි ඉල්ලුම කළමනාකරණය කිරීම සහ පුනර්ජනනීය විදුලිබල සංවර්ධනය කිරීම.
6. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය.
7. අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන්ට පැවරී ඇති අනෙකුත් සියලුම විෂයයන්ට අදාළ කටයුතු.
8. අමාත්‍යාංශය යටතේ පවතින ව්‍යවස්ථාපිත ආයතනයන් අධීක්ෂණය කිරීම.

තව ද එම ගැසට් නිවේදනය ප්‍රකාරව පහත දැක්වෙන ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතනද මෙම අමාත්‍යාංශය යටතට පැවරී ඇත.

## ව්‍යවස්ථාපිත මණ්ඩල හා ආයතන

1. ලංකා විදුලිබල මණ්ඩලය සහ එහි පාලිත සමාගම්
2. ලංකා විදුලි(පුද්ගලික) සමාගම
3. සීමාසහිත ලංකා ගල්අඟුරු (පුද්ගලික) සමාගම
4. සීමාසහිත එල්ටීඑල් හෝල්ඩිංග්ස් (පුද්ගලික) සමාගම
5. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය
6. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලය
7. ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති නියාමන සභාව

එමෙන්ම අමාත්‍යාංශයේ කටයුතු පවත්වාගෙන යාම සඳහා පහත සඳහන් නෛතික විධිවිධාන අනුගමනය කල යුතුය.

## ක්‍රියාත්මක කළ යුතු නීති

1. 2009 අංක 20 දරණ ශ්‍රී ලංකා විදුලිබල පනත
2. 2007 අංක 35 දරණ ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත
3. 1985 අංක 2 දරණ බලශක්ති සංරක්ෂණ අරමුදල පනත
4. 2014 අංක 40 දරණ ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති පනත
5. වෙනත් අමාත්‍යවරයෙක් යටතට නිශ්චිතව පවරා නොමැති, අමාත්‍යාංශයේ විෂය පථයට අදාල අනෙකුත් සියලු ව්‍යවස්ථාවන්

ඉටු කරනු ලබන කාර්යයන් අනුව පහත සඳහන් පරිදි අංශ වෙන්කර ඇත.



# සංවිධාන ව්‍යුහය



ලේකම්
අතිරේක ලේකම් (පාලන හා ප්‍රසම්පාදන)
අතිරේක ලේකම් (සංවර්ධන හා සැලසුම්)
අතිරේක ලේකම් (විදුලිබල හා බලශක්ති)
අතිරේක ලේකම් (තාක්ෂණ)
ප්‍රධාන මූල්‍ය නිලධාරී
ජ්‍යෙ.ස.ලේ. (පාලන)
ජ්‍යෙ.ස.ලේ. (ප්‍රසම්පාදන)
අධ්‍යක්ෂ (සංවර්ධන)
අධ්‍යක්ෂ (සැලසුම්)
අධ්‍යක්ෂ (විදුලිබල හා බලශක්ති)
අධ්‍යක්ෂ (තාක්ෂණ)
ප්‍රධාන අභ්‍යන්තර විගණක
සහකාර ලේකම් (පාලන)
නීති නිලධාරී
සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)
සහකාර අධ්‍යක්ෂ) (සංවර්ධන)
සහකාර අධ්‍යක්ෂ (සැලසුම්)
ගණකාධිකාරී
පරිපාලන නිලධාරී
භාෂා පරිවර්ථක
තොරතුරු තාක්ෂණ නිලධාරී
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
තොරතුරු තාක්ෂණ සහකාර
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය
සහයක කාර්යය මණ්ඩලය

# 02. විදුලිබල හා බලශක්ති අංශය

## ප්‍රධාන කාර්යයන්

1. ශ්‍රී ලංකාවේ බලශක්ති උත්පාදනය සඳහා ද්‍රවීකෘත ස්වභාවික වායුව පරිසර හිතකාමී ඉන්ධනයක් ලෙස හඳුන්වාදීම.
2. මහා පරිමාණ හා මධ්‍යම පරිමාණ LNG ව්‍යාපෘති, ජල විදුලිබලාගාර ව්‍යාපෘති, ගල් අඟුරු බලාගාර හා තාප බලාගාර ව්‍යාපෘති සඳහා අනුමත කිරීම, ක්‍රියාත්මක කිරීම, ඉඩම් අත්පත් කරගැනීම.
3. ලංකා විදුලිබල මණ්ඩලයේ ආයතනික සැලැස්ම, වාර්ෂික අයවැය, මූල්‍ය ප්‍රගතිය ක්‍රියාත්මක කිරිම සහ ප්‍රගතිය අධීක්ෂණය කිරීම.
4. ඉහත සඳහන් ව්‍යාපෘතිවලට අදාලව විදේශ සම්පත් දෙපාර්තමේන්තුව සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
5. විදුලිබල හා බලශක්ති අංශයට අනුයුක්ත කාර්යය මණ්ඩලයේ අභ්‍යන්තර පරිපාලනයද ඇතුලත්ව අංශයේ සමස්ථ පරිපාලනය.
6. විදුලිබල හා බලශක්ති ක්ෂේත්‍රයට අදාළව ගරු විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමා, ගරු විදුලිබල හා බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා සහ ලේකම් විසින් වරින් වර පවරනු ලබන සියළුම රාජකාරි කටයුතු.

## කාර්ය සාධනය

1. ලංකා විදුලිබල මණ්ඩලය මඟින් ක්‍රියාත්මක කරනු ලබන අදියර II මෙ.වො.900 ලක්විජය ගල් අඟුරු බලාගාරය, බ්‍රෝඩ්ලන්ඩ් ජලවිදුලි බලාගාරය, මහ කොළඹ සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් හානිය අවම කිරීමේ ව්‍යාපෘතිය හා ජාතික විදුලිබල සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධනය හා කාර්යක්ෂමතාවය ඉහල නැංවීමේ ව්‍යාපෘති අධීක්ෂණය සහ සම්පත් දායකත්වය.

2. භූමිය අත්පත්කරගැනීම - ලංවිම ක්‍රියාකාරකම්

| ව්‍යාපෘතිය | විස්තර හා අරමුණු | ප්‍රමාණය |
|---|---|---|
| මොරගොල්ල ජලවිදුලි බලාගාරය | මහනුවර දිස්ත්‍රික්කයේ උඩපළාත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉඩම<br>මොරගොල්ල ජලවිදුලි බලාගාරය සඳහා පිවිසුම් මාර්ග ඉදිකිරීම | හෙක්ටයාර 07.00 |
| ජාතික සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් ජාල සංවර්ධන සහ කාර්යක්ෂමතා ප්‍රවර්ධන ව්‍යාපෘතිය | ගම්පහ දිස්ත්‍රික්කයේ වෙරළුගම්පොත පිහිටි ඉඩම<br>කිරිදිවැල වහරු / ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම | පර්චසය 80.00 |
| හරිත බලශක්ති සංවර්ධන හා බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය | කොළඹ දිස්ත්‍රික්කයේ මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉඩම<br>පන්නිපිටිය ග්‍රිඩ් උපපොළ ආසන්නයේ පර්යන්ත කුළුණ ඉදිකිරීම | පර්චස 20.80 |

| | | |
|---|---|---|
| මන්නාරම සුළං බලාගාරය ව්‍යාපෘතිය | i. මන්නාරම් දිස්ත්‍රික්කයේ මන්නාරම් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉඩම<br><br>WTG ඒකක සහ ප්‍රවේශ මාර්ග ඉදිකිරීම<br><br>ii. සුළං ටර්බයින 07 ඉදිකිරීම සහ ප්‍රවේශ මාර්ග - පළමු තීරුවේ කොටස | හෙක්ටයාර 69.0904<br><br>හෙක්ටයාර 32.1532 |
| දෙකටන පවතින ගැන්ට්‍රිය සඳහා ඉඩම් අවශ්‍යතාවය | ගම්පහ දිස්ත්‍රික්කයේ නාමලුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉඩම<br><br>ප්‍රවේශ මාර්ග ඉදිකිරීම | පර්චස 05.00 |
| බුලත්සිංහල | කළුතර දිස්ත්‍රික්කයේ බුලත්සිංහල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉඩම<br><br>බුලත්සිංහල පාරිභෝගික සේවා මධ්‍යස්ථානය හොරණ ප්‍රදේශයේ ඉදිකිරීම | හෙක්ටයාර 0.4047 |
| මිල්ලනිය | කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉඩම<br><br>මිල්ලනිය පාරිභෝගික සේවා මධ්‍යස්ථානය බණ්ඩාරගම ප්‍රදේශයේ ඉදිකිරීම | රූඩ් 03 හා පර්චස 28.5 |
| නව කැළණි පාලම ව්‍යාපෘතිය | කොළඹ දිස්ත්‍රික්කයේ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පිහිටි ඉඩම<br><br>කි.වො.132 වන සම්ප්‍රේෂණ කුළුණ ඉදිකිරීම | හෙක්ටයාර 0.035 |

වගු අංක 2.1

3. දිවයිනෙහි පැවැති නියං කාලගුණ අවධියෙහි අඛණ්ඩ විදුලි සැපයුමක් තහවුරු කිරීම සඳහා වන වැඩසටහන් සඳහා අනුමැතිය
අඛණ්ඩ විදුලි සැපයුමක් ලබාදීම සඳහා පහත සඳහන් වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට පියවර ගෙන ඇත.
   3.1. විදුලි බලාගාර තුනක විදුලිබලය මිලදී ගැනීමේ ගිවිසුම් දීර්ඝ කිරීම.
   3.2. මාස 06ක කාලයක් සඳහා මෙ.වො 100ක අතිරේක විදුලිබලයක් පද්ධතියට එකතු කිරීම.
4. ශ්‍රී ලංකාවේ බලශක්ති උත්පාදනය සඳහා පරිසර හිතකාමී ඉන්ධනයක් ලෙස ද්‍රවීකෘත ස්වභාවික වායු හඳුන්වාදීම. එය ක්‍රියාත්මක කිරීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග ගෙන තිබේ.
   4.1. <u>රජයෙන් රජයට පදනම මත මෙ.වො 500ක ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරයක් ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ඉන්දියානු රජය සමඟ</u>
      - ආර්ථික ව්‍යාපාර සඳහා දක්වනු ලබන සහයෝගීතාව වෙනුවෙන් ඉන්දියානු ජනරජය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය අතර 2017.04.26 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
      - 2017.06.23 දින ගරු ඉන්දියානු මහ කොමසාරිස් වෙත අභිප්‍රාය ලිපියක් නිකුත් කර තිබේ.
   4.2. <u>රජයෙන් රජයට පදනම මත මෙ.වො 500ක ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරයක් කෙරවලපිටියේ ඉදිකිරීම සඳහා ශ්‍රී ලංකා රජය සහ ජපාන රජය සමඟ</u>

- 2017.06.23 දින ශ්‍රී ලංකාවේ ගරු ජපාන මහ කොමසාරිස් වෙත අභිප්‍රාය ලිපියක් නිකුත් කර තිබේ. ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් මූලික සැකසුම් සඳහා ජපානය සහ ශ්‍රී ලංකාවේ නියෝජිතයින් ඇතුලත්ව ඒකාබද්ධ කාර්යය කණ්ඩායමක් පිහිටුවන ලදි.
- 2017.07.25 දින (කොළඹදී) 2017.10.25 දින (ජපානයේදී) හා 2018.02.23 දින (කොළඹදී) ඒකාබද්ධ කාර්යය කණ්ඩායම් රැස්වීම් පවත්වන ලදී.

4.3. <u>රජයෙන් රජයට පදනම මත මෙ.වො 400 ද්‍රවීකෘත ස්වභාවික වායු බලාගාරයක් සහ ද්‍රවීකෘත ස්වභාවික වායු ලබාගැනීමේ පර්යන්තයක් සඳහා ශ්‍රී ලංකා රජය සහ චීන රජය අතර</u>

- චීන රජය සහ ශ්‍රී ලංකා රජය අතර 2017.05.09 දින අවබෝධතා ගිවිසුමක් අත්සන් කරන ලදී.
- 2018.01.10 දින පළමු ඒකාබද්ධ කාර්යය කණ්ඩායම් රැස්වීම පවත්වන ලදී.

4.4. <u>දකුණු කොරියාවේ SK EසහS සමාගම මඟින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා මත "Swiss-Challenge" ප්‍රසම්පාදන ක්‍රමවේදයක් මඟින් LNG මිලදී ගැනීම හා පාවෙන පර්යන්තයක් සහ ගබඩා ඒකකයක් (FRSU) සංවර්ධනය</u>

5. ග්‍රාමීය විදුලි යෝජනා ව්‍යාපෘති, පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති හැර ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි (පුද්ගලික) සමාගම, වෙස්ට් කොස්ට් ලිමිටඩ්, ලංකා ට්‍රාන්ස්ෆෝමර් ලිමිටඩ් සහ ලක්දනව් ආයතනවල ව්‍යාපෘතිවල මෙහෙයුම් සහ නඩත්තු කටයුතු සඳහා ආනයනය කරනු ලබන යන්ත්‍ර හා උපකරණ VAT, රේගු බදු, NBT සහ PAL යන බදු වලින් නිදහස් කරන ලෙස එම ආයතන වලින් ලැබුණු ඉල්ලීම් සඳහා මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශය වෙත නිර්දේශ ලබාදුනි.
6. ලංකා විදුලිබල මණ්ඩලයේ ව්‍යාපෘති වල කාර්යයන් සඳහා පැමිණෙන විදේශීය කාර්යය මණ්ඩල වෙනුවෙන් වීසා ලබාදීම සඳහා ආගමන විගමන දෙපාර්තමේන්තුවට නිර්දේශ ලබාදුනි.

# 03 සැලසුම් අංශය

## ප්‍රධාන කාර්යයන්

1. විදුලිබල ක්ෂේත්‍රයේ සැලසුම් සකස් කිරීම
2. ව්‍යාපෘති, වැඩසටහන් සහ ක්‍රියාකාරී සැලසුම් සකස් කිරීම
3. ප්‍රගති සමාලෝචනය සහ අධීක්ෂණ කටයුතු
4. පර්යේෂණ හා සංවර්ධන කටයුතු
5. ආපදා කළමනාකරණ වැඩසටහන් සකස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම
6. සංවර්ධන ව්‍යාපෘති සඳහා වන වාර්ෂික අයවැය සකස් කිරීම
7. විදුලිබල ක්ෂේත්‍රයට අදාළ දේශගුණික විපර්යාස පිළිබඳ කටයුතු හා පාරිසරික කටයුතු
8. තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීමට අදාළ කාර්යයන්
9. ස්ත්‍රී පුරුෂභාවය පදනම් කර ගත් අයවැය වැඩසටහන්වලට අදාළ කාර්යයන්

## කාර්ය සාධනය

**1. විදුලිබල ක්ෂේත්‍රයේ සැලසුම් සකස් කිරීම**

i. විදුලිබල ක්ෂේත්‍රයේ අදාළ පාර්ශ්වකරුවන් සහ ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාවේ (PUCSL) අදහස් සහිතව, ලංවිම 2018 - 2037 දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම (LTGEP) සකස් කිරීම සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණ කටයුතු 2017 වර්ෂයේ දී සිදු කරන ලදී.

ii. 2018 - 2037 දිගු කාලීන ජනන ව්‍යාප්ති සැලැස්ම පිළිබඳව ඇති වූ ගැටලු, ලංකා විදුලිබල මණ්ඩලය, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව හා බලශක්තිය පිළිබඳ පාර්ලිමේන්තු ආංශික අධීක්ෂණ අනු කාරක සභාව සමග සම්බන්ධීකරණය කරන ලදී.

iii. අමාත්‍යාංශයේ එක් එක් අංශයන් සඳහා සහ අමාත්‍යාංශ අයවැය ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක වන සියලු සංවර්ධන ව්‍යාපෘති සඳහා 2017 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කරන ලදී.

**2. 2018 වර්ෂය සඳහා අමාත්‍යාංශයේ ප්‍රාග්ධන අයවැය සකස් කිරීම.**

අමාත්‍යාංශයේ විෂයය පථය යටතේ වන ආයතනවලින් ඉදිරිපත් වූ සියලු යෝජනා සමාලෝචනය කිරීමෙන් පසු, විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශයේ ප්‍රාග්ධන අයවැය කෙටුම්පත සකස් කරන ලදී. 2018 ප්‍රාග්ධන අයවැය සකස් කර අවසන් කිරීම සඳහා අයවැය සමාලෝචන රැස්වීම පවත්වන ලදී.

**3. "2017 කාර්ය සාධනය සහ 2018 වර්ෂය සඳහා වැඩසටහන්" වාර්තාව සකස් කිරීම.**

"2017 කාර්ය සාධනය සහ 2018 වර්ෂය සඳහා වැඩසටහන්" වාර්තාව සකස් කිරීම, 2018 වාර්ෂික අයවැය සඳහා වන පූර්ව අවශ්‍යතාවකි. විදුලිබල හා පුනර්ජනනීය අමාත්‍යාංශයේ සහ අමාත්‍යාංශයේ විෂයය පථය යටතේ වන ආයතනවල 2017 වර්ෂයේ ප්‍රාග්ධන අයවැයට අදාළ කාර්ය සාධනය සහ 2018

වර්ෂය සඳහා සැලසුම් කර ඇති වැඩසටහන් අන්තර්ගත කර මෙම වාර්තාව සකස් කරන ලදී. 2017 දෙසැම්බර් මස 05 දින පැවති අයවැය කාරක සභා විවාද අවස්ථාවේ දී මෙම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කරන ලදී. මෙම කාර්ය සාධන වාර්තාව, ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා, ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා, අමාත්‍යාංශයේ එක් එක් අංශයන්, අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සහ අනෙකුත් අමාත්‍යාංශ අතර බෙදා හරින ලදී.

### 4. සංවර්ධන ව්‍යාපෘතිවල කාර්ය සාධනය අධීක්ෂණය

ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් ක්‍රියාත්මක කරනු ලබන (ජනන, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම්) විදුලි බල ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘති අමාත්‍යාංශය මගින් ආරම්භ කර ඇත. විදුලි සැපයුමේ විශ්වසනීයත්වය සහ ගුණාත්මක භාවය තහවුරු කිරීම සහ නව ජනන පහසුකම් වෙතින් විදුලිය එක් කර ගැනීමේ හැකියාව ඇති කිරීම සඳහා සම්ප්‍රේෂණ සංවර්ධන ව්‍යාපෘති රාශියක් ක්‍රියාත්මක කිරීමෙන්, සම්ප්‍රේෂණ සහ බෙදාහැරීම් ජාලය සංවර්ධනය කර ඇත. පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් ජාලයට සංකලනය කිරීම වර්ධනය කිරීම සඳහා අවශ්‍ය වැඩිදියුණු කිරීම් සිදු කරන ලදී. සැලසුම් කරන ලද පරිදි ව්‍යාපෘති අවසන් කිරීම තහවුරු කිරීම සඳහා අමාත්‍යාංශය මගින් මෙම සියලු ව්‍යාපෘතීන්ගේ කාර්ය සාධනය අධීක්ෂණය කරනු ලබයි.

i. විදුලිබල ක්ෂේත්‍රයේ සංවර්ධන ව්‍යාපෘතිවල භෞතික හා මූල්‍ය ප්‍රගතිය කාර්තු වශයෙන් අධීක්ෂණය කරන ලද අතර, අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් සහ අමාත්‍යාංශය යටතේ වන ආයතනවල ප්‍රධානීන්ගේ හා නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පවත්වන ලදී.
ii. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේදී මතු වූ ගැටලු සඳහා අවශ්‍ය විසඳුම් සහ උපදෙස්, මෙම රැස්වීම්වලදී ලබා දෙන ලදී.
iii. ප්‍රගති වාර්තා සකස් කර, අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ සහ අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී.
iv. ජාතික ප්‍රතිපත්ති රාමුවට අදාළ ප්‍රගති වාර්තා, කාර්තුමය ප්‍රගති වාර්තා, මධ්‍ය වාර්ෂික ප්‍රගති වාර්තා සහ 2017 වර්ෂයේ ප්‍රගති වාර්තා සකස් කර, ජනාධිපති කාර්යාලය, මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය, ආසියානු සංවර්ධන බැංකුව (ADB), ජපාන ජාත්‍යන්තර සහයෝගිතා ඒජන්සිය (JICA), ශ්‍රී ලංකා මහ බැංකුව ආදී අදාළ ආයතන වෙත ඉදිරිපත් කරන ලදී.
v. "සූර්ය බල සංග්‍රාමය" වැඩසටහනේ මාසික ප්‍රගතිය අධීක්ෂණය සිදු කරන ලදී.

### 5. ආපදා කළමනාකරණ වැඩසටහන සහ ක්‍රියාකාරකම්

i. ලංකා විදුලිබල මණ්ඩලයේ සහ ලංකා විදුලි පුද්. සමාගමේ සහයෝගය ඇතිව, 2017 මැයි මස රට තුළ පැතිර ගිය ගංවතුර තත්ත්වය සම්බන්ධයෙන්, විදුලිබල ක්ෂේත්‍රයේ පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරුව (PDNA) සිදු කරන ලද අතර, 2017 වර්ෂයේ දී ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් පළ කරන ලද විදුලි බල ක්ෂේත්‍රයේ පශ්චාත් ආපදා අවශ්‍යතා තක්සේරු වාර්තාව සකස් කරන ලදී.
ii. 2017 වර්ෂයේ ඇති වූ ගංවතුර තත්ත්වය සම්බන්ධයෙන් විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රතිසාධන රාමුව සකස් කරන ලදී. අදාළ වාර්තාව සකස් කර ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මගින් පළ කරන ලදී.
iii. අපදා කළමනාකරණ මධ්‍යස්ථානය මගින් සකස් කරන ලද, විදුලිබල ක්ෂේත්‍රයේ මාර්ග ගත (Online) දත්ත එකතු කිරීමේ සහ විශ්ලේෂණ පද්ධතිය සංවර්ධනය කිරීම සඳහා ආපදා පහසුකම් සලසා ඇත.

### 6. ජාතික පරිසර සතිය

ජාතික පරිසර වැඩසටහනට සමගාමීව, අමාත්‍යාංශයේ පරිසර වැඩසටහන සංවිධානය කර පවත්වන ලදී. පරිසර සතිය සනිටුහන් කිරීම සඳහා පහත දැක්වෙන වැඩසටහන් පවත්වන ලදී.

i. පරිසර සංරක්ෂණය සහ කසල කළමනාකරණ පිළිබඳ දේශනයක් 2017 මැයි මස 29 වන දින අමාත්‍යාංශයේ දී පවත්වන ලදී. මධ්‍යම පරිසර අධිකාරියේ සම්පත් දායකයකු විසින් එම දේශනය පවත්වන ලදී.

ii. කැලණිතිස්ස බලාගාර භූමියේ පිහිටි ලංවිම ජනන මූලස්ථාන පරිශ්‍රයේ දී රුක් රෝපණ වැඩසටහනක් සංවිධානය කර පවත්වන ලදී.

iii. ලෝක පරිසර දිනය සනිටුහන් කිරීම වෙනුවෙන්, කෑගල්ල දිස්ත්‍රික්කයේ නිවාස ඒකක 1,000ක් සඳහා පරිසර හිතකාමී භාණ්ඩ බෙදා දීමේ වැඩසටහනක් 2017 ජූනි මස 07 වන දින පවත්වන ලදී. මෙම වැඩසටහන, අමාත්‍යාංශය යටතේ වන සෑම ආයතනයකම දායකත්වයෙන් සහ කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහයෝගයෙන් පවත්වන ලදී. මෙහි දී කොම්පෝස්ට් සැකසීමේ බඳුනක්, පරිසර හිතකාමී මල්ලක් හා බලශක්තිය ඉතිරි කිරීම සඳහා එල්ඊඩී විදුලි පහනක් ඇතුළත් පැකේජයක් සෑම නිවසකට ම ලබා දෙන ලදී.

iv. විදුලිබල ක්ෂේත්‍රයේ කාබන් විමෝචනය අඩු කිරීම සඳහා ජාතික මට්ටමෙන් පිළිගත් දායකත්වය (NDCs) පිළිබඳ පූර්ව සූදානම ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම සඳහා පහසුකම් සලසා ඇත. මෙම ක්‍රියාකාරී සැලැස්ම දේශගුණ විපර්යාස පිළිබඳ ලේකම් කාර්යාලය වෙත ඉදිරිපත් කරන ලද අතර, 2017 වර්ෂයේ දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ දී අනුමත කර ඇත.

v. ලෝක බලශක්ති සභාව සමග එකඟ වී ඇති ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ලෝක බලශක්ති සභාව, ශ්‍රී ලංකාවේ සාමාජික කමිටුව හා අදාළ අනෙකුත් ආයතන සඳහා පහසුකම් සැලසීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කර ඇත.

vi. පුනර්ජනනීය බලශක්ති ජනන ව්‍යාපෘති සඳහා කාබන් හවුල්කාරීත්ව පහසුකම වැඩසටහන ලෝක බැංකුවේ සහයෝගය ඇතිව ක්‍රියාත්මක කිරීමට පහසුකම් සලසා ඇත. ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමග, පරිසර සමාජීය කළමනාකරණ රාමුව සකස් කර නිම කිරීමට පහසුකම් සලසා ඇත.

vii. ශ්‍රී ලංකාවේ විවෘත ආර්ථිකයට 40 වසරක් පිරීම සැමරීම සඳහා 2017 ජූලි මස 27 දින සිට මහරගම, ජාතික තරුණ මධ්‍යස්ථානයේ දී පවත්වන ලද ජාතික තලයේ ප්‍රදර්ශනය සඳහා අමාත්‍යාංශය සහ ඒ යටතේ වන ආයතන නියෝජනය කරමින් ප්‍රදර්ශන කුටියක් ඉදිරිපත් කිරීමට සම්බන්ධීකරණ කටයුතු සහ පහසුකම් සැලසීම සිදු කරන ලදී.

**7. ස්ත්‍රී පුරුෂ භාවය පදනම් කරගත් අයවැය වැඩසටහන්වලට අදාළ කාර්යයන්**

කාන්තාවන් මූලික කරගෙන සිදු කරනු ලබන මූල්‍යමය වැඩසටහන් ක්‍රියාත්මක කිරිම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සිදු කරගෙන යනු ලැබේ. කාන්තා ගෘහ මූලික නිවාස සඳහා වන ජාතික ක්‍රියාකාරි සැලැස්ම අවසන් කිරිම සඳහා දායකත්වය සපයා දී ඇති අතර ඒ සඳහා පහසුකම් සපයා ඇත.

ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් වන පහත සඳහන් අමාත්‍ය මණ්ඩල සංදේශ 2017 වර්ෂයේ දී මෙම අංශය මගින් ඉදිරිපත් කර ඇත.

i. "ආර්ථික කළමනාකරණය පිළිබඳ අමාත්‍ය මණ්ඩල කමිටුව" 2017 මාර්තු 29 දිනැතිව ඉදිරිපත් කරන ලද අමාත්‍ය මණ්ඩල සංදේශය පිළිබඳ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයාගේ නිරීක්ෂණ.

ii. ශ්‍රී ලංකාවේ විදුලිබල ජනන සංයුතිය තීරණය කිරීම

# 04. සංවර්ධන අංශය

## ප්‍රධාන කාර්යයන්

1. ජාතික බලශක්ති ප්‍රතිපත්ති සම්බන්ධ කටයුතු
2. රට තුළ ග්‍රාමීය විදුලියන වැඩසටහන ක්‍රියාත්මක කිරීම
3. ව්‍යාපෘති මූල්‍යායනය සහ දායකත්ව සම්බන්ධීකරණය - බහුපාර්ශ්වීය සම්බන්ධීකරණය
4. පුනර්ජනනීය බලශක්ති සංවර්ධනය හා ඒ සඳහා පහසුකම් සැලසීම
5. තොරතුරු තාක්ෂණ කාර්යයන් සංවර්ධනය
6. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ වන කාර්යයන්
7. බලශක්ති සංරක්ෂණය සහ කාර්යක්ෂම භාවිතය පිළිබඳ වැඩසටහන

## කාර්ය සාධනය

**1. ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා ක්‍රමෝපායයන්**

2017 වර්ෂයේ දී ක්‍රියාකාරී කණ්ඩායම විසින් "ජාතික බලශක්ති ප්‍රතිපත්තිය හා ක්‍රමෝපායයන්" සමාලෝචනයට ලක් කර යාවත්කාලීන කරන ලදී. පාර්ශ්වකාර ආයතන / පුද්ගලයන්ගෙන් දළ කෙටුම්පත සඳහා උපදෙස් ලබා ගැනීම අවසන් කරන ලද අතර, මහජන අදහස් දැක්වීම් සඳහා 2017 වර්ෂයේ දී අදාළ කෙටුම්පත ප්‍රසිද්ධ කරන ලදී. එසේ ලබාගත් අදහස්, නිරීක්ෂණ හා මතයන් ඇතුළත් කරමින් අවසන් කෙටුම්පත නිම කරන ලදී. මෙම කෙටුම්පත අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත ය.

**2. ග්‍රාමීය විදුලියනය**

ග්‍රාමීය ජනතාවගේ ජීවිතවල ගුණාත්මකභාවය ඉහල නංවාලමින් ග්‍රාමීය ප්‍රදේශවල සමබර ආර්ථික වර්ධනයක් ඇති කරලීම උදෙසා ග්‍රාමීය විදුලියනය තවදුරටත් ව්‍යාප්ත කිරීම අමාත්‍යාංශයේ අරමුණයි. මෙම වසරේ දී රු. බිලියන 10.6ක වටිනාකමින් යුතු වන, බෙදාහැරීම් උපපොළ 118 ක්ද ඇතුළත් ව, මධ්‍ය වෝල්ටීයතා බෙදාහැරීම් රැහැන් මාර්ග කි.මී. 692ක් සහ පහළ වෝල්ටීයතා විදුලි රැහැන් මාර්ග කි.මී. 3,239ක් ඉදි කරන ලදී. 2017 වර්ෂයේ දී නව ගෘහස්ථ විදුලි සේවා සබඳතා 181,627 ක්ද ඇතුළත් ව නව විදුලි සේවා සබඳතා 240,336ක් ලබා දී ඇත. බෙදාහැරීම් ජාලයේ අඛණ්ඩ වැඩි දියුණු කිරීම් හේතුවෙන්, බස්නාහිර හා දකුණු පළාත් සහ රත්නපුර, මහනුවර, පොළොන්නරුව හා වවුනියාව දිස්ත්‍රික්කයන් 100%ක විදුලියන මට්ටම කරා එළඹ ඇත. කෑගල්ල, අම්පාර, මඩකලපුව, යාපනය, අනුරාධපුරය, ත්‍රිකුණාමලය සහ පුත්තලම දිස්ත්‍රික්ක 99%ක විදුලියන මට්ටමක් කරා එළඹ ඇත. අනෙකුත් දිස්ත්‍රික්කයන් 95%ට වැඩි විදුලියන අනුපාතිකයන් ළඟා කරගෙන ඇත.

**3. ඉල්ලුම් පාර්ශ්වීය බලශක්ති කළමනාකරණය පිළිබඳව වන ජනාධිපති කාර්ය සාධන බලකාය**

ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රය ආනයනිත ගල් අඟුරු සහ ඛනිජ සම්පත් මත දැඩි ලෙස යැපෙන බැවින් රටේ ආර්ථිකය වෙත දැඩි බලපෑමක් ඇති කරයි. ඉල්ලුම් පාර්ශ්වීය බලශක්ති කළමනාකරණය සඳහා වන

ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් ක්‍රියාත්මක කරනු ලබන පහත සඳහන් ව්‍යාපෘති මගින් මීළඟ වසර 05ක කාලය තුළ ගිගා වොට් පැය 1,000ක සාමාන්‍ය බලශක්ති ධාරිතාවක් ඉතිරි කර ගත හැකි වනු ඇතැයි බලාපොරොත්තු වෙයි. එම ව්‍යාපෘති, පහත විස්තර කර ඇති පරිදි ක්ෂේත්‍රයන් 09ක් යටතේ ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය අඛණ්ඩව පහසුකම් සලසයි.

ජනාධිපති කාර්ය සාධන බලකාය මගින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘති

| | තාක්ෂණය | රු. මිලියන | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | **2016** | **2017** | **2018** | **2019** | **2020** | වසර 2020 වන විට වාර්ෂික ඉතිරිය (ගි.වො. පැය) |
| **1** | කාර්යක්ෂම වායු සමීකරණය (වාණිජ, කාර්මික, රාජ්‍ය) | 1,486 | 666 | 883 | 1,183 | 1,428 | 84 |
| **2** | කාර්යක්ෂම ආලෝකකරණය (රෝහල්, පාසැල්, ආරක්ෂක, වාණිජ, කාර්මික) | 2,529 | 1,134 | 1,503 | 2,014 | 2,430 | 250 |
| **3** | කාර්යක්ෂම ශීතකරණ (ගෘහස්ථ) | 6,460 | 2,899 | 3,838 | 5,146 | 6,208 | 161 |
| **4** | කාර්යක්ෂම ශීතාගාර (වාණිජ, කාර්මික, රාජ්‍ය) | 2,958 | 1,327 | 1,757 | 2,357 | 2,842 | 41 |
| **5** | කාර්යක්ෂම මෝටර (තේ කර්මාන්තය) | 1,710 | 767 | 1,016 | 1,362 | 1,643 | 86 |
| **6** | තාප දීප්ත ගෘහස්ථ විදුලි පහන් ඉවත් කිරීම (මේ සඳහා එල්ඊඩී පහන් මිලියන 10ක් නිවාස අතර බෙදාහැරීමට නියමිතය.) | 109 | 49 | 65 | 87 | 105 | 139 |
| **7** | කාර්යක්ෂම විදුලි පංකා | 4,651 | 2,087 | 2,763 | 3,705 | 4,470 | 298 |
| **8** | හරිත ගොඩනැගිලි (වාණිජ, කාර්මික) | 6,016 | 2,699 | 3,574 | 4,792 | 5,781 | 43 |
| **9** | සුහුරු නිවාස (ගෘහස්ත) | - | 2,161 | 4,322 | 6,483 | 10,805 | 139 |
| | **එකතුව** | **25,919** | **13,789** | **19,721** | **27,129** | **35,712** | **1,241** |

වගු අංක 4.1

## 4. සූර්ය බල සංග්‍රාමය වැඩසටහන

“සූර්ය බල සංග්‍රාමය” යනු විදුලි පාරිභෝගිකයන්ගේ නිවාසවල / පරිශ්‍රවල පියසි මත සවි කළ සූර්ය පැනල මගින් නිපදවෙන විදුලිය ජාතික ජාලයට සම්බන්ධ කිරීම සඳහා හඳුන්වා දුන් ප්‍රජා පාදක විදුලි ජනන වැඩසටහනකි. අමාත්‍යාංශය, මෙම ව්‍යාපෘතිය 2016 සැප්තැම්බර් මස 06 දින ආරම්භ කරන ලද අතර 2017 වර්ෂය පුරා පවත්වා ගෙන යන ලදී. ශුද්ධ මනුකරණය (Net Metering), ශුද්ධ ගිණුම්කරණය (Net Accounting) හා නෙට් ප්ලස් (Net Plus) යන ක්‍රමවේද තුන අනුව මෙම වැඩසටහන ක්‍රියාත්මක කරන ලදී. අමාත්‍යාංශය, මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට, ලංකා විදුලිබල මණ්ඩලයට සහ ලංකා විදුලි පුද්ගලික සමාගමට අවශ්‍ය ප්‍රතිපත්තිමය තීන්දු තීරණ ලබා දී ඇත.

- සූර්ය බල සංග්‍රාමය I

**i. <u>සූර්ය පියසි වැඩසටහන</u>**

මෙම වැඩසටහනේ ඉලක්කය වනුයේ 2025 වර්ෂය වන විට සූර්ය පියසි 1,000,000ක් මගින් මෙගා වොට් 1,000ක විදුලි ධාරිතාවක් ජනනය කිරීමයි. 2017 වර්ෂය තුළ දී පාරිභෝගිකයින් 7,214ක් විසින් ජාතික ජාලයට මෙගා වොට් 100ක ධාරිතාවක් සම්බන්ධ කර ඇත.

**ii. <u>"රිවි අරුණ" වැඩසටහන</u>**

මෙම වැඩසටහන මගින්, 2017 වර්ෂය තුළ දී ආගමික ස්ථාන 135ක් සඳහා සූර්ය පියසි හඳුන්වා දී ජාලයට සම්බන්ධ කර ඇත. මේ සඳහා විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි පුද්ගලික සමාගම හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය මගින් අරමුදල් සපයන ලදී.

| | | | |
|---|---|---|---|
| *පන්සල්* | *126* | *ඉස්ලාම් දේවස්ථාන* | *04* |
| *කෝවිල්* | *03* | *ක්‍රිස්තියානි දේවස්ථාන* | *02* |

**iii. <u>සූර්ය බල ගම්මාන සංකල්පය</u>**

ගම්මාන 10ක අඩු ආදායම්ලාභී නිවාස ඒකක 5,000ක් සූර්ය පියසි විදුලි නිෂ්පාදකයින් ලෙස සංවර්ධනය කිරීම සඳහා අමාත්‍යාංශය මගින් මෙම වැඩසටහන ආරම්භ කරන ලදී. මින් පළමු වැඩසටහන ලංකා විදුලිබල මණ්ඩලය හා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය සමග පොළොන්නරුව, බකමූණ ගම්මානයේ දී ආරම්භ කරන ලදී.

- සූර්ය බල සංග්‍රාමය II
  මෙගා වොට් 01 බැගින් 60ක් සහ මෙ.වො. 01 බැගින් 90ක් ලෙස වන සූර්ය බල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍යාංශය පහසුකම් සලසා ඇත. 2017 වර්ෂයේ දී මෙ.වො. 01 x 60 ව්‍යාපෘති යටතේ තරගකාරී ලංසු ක්‍රමවේදය මගින් සංවර්ධකයින් 37ක් තෝරා ගන්නා ලදී.

- සූර්ය බල සංග්‍රාමය III
  මෙගා වොට් 10 බැගින් වන සූර්ය බල ව්‍යාපෘති 05ක් ලෙස මෙ.වො. 50ක සූර්ය බල ධාරිතාවක් ජනනය කිරීමට සැලසුම් කරන ලදී.
  වවුනතිවුහි මෙ.වො. 10 සූර්ය බල ව්‍යාපෘතිය 2017 වර්ෂයේ දී ආරම්භ කරන ලදී.

## 5. සූර්ය බල උද්‍යාන සහ සුළං බල උද්‍යාන ක්‍රියාත්මක කිරීම

i. පුනරීන් සහ මොණරාගල සූර්ය බල උද්‍යාන ඉදි කිරීම ආරම්භ කිරීම සහ චුන්නාකම් ප්‍රදේශයේ පිහිටි සුළං බල උද්‍යානය ක්‍රියාත්මක කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලයට, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට සහ පුද්ගලික අංශයට පහසුකම් සලසා ඇත.

ii. පුනරීන් ප්‍රදේශයේ සූර්ය / සුළං දෙමුහුම් බලශක්ති උද්‍යානය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියට පහසුකම් සලසා ඇත.

## 6. ව්‍යාපෘති මූල්‍යනය සහ දායකත්ව සම්බන්ධීකරණය

i. 2017 වර්ෂයේ දී සූර්ය පියසි විදුලි ජනන ව්‍යාපෘතිය සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙතින් ඇ.ඩො. මිලියන 50ක අරමුදලක් ලබා ගැනීම සඳහා සාර්ථක ලෙස සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

ii. නව ව්‍යාපෘති ආරම්භ කිරීම හා විදුලිබල ක්ෂේත්‍රයේ නව ආයෝජන අවස්ථාවන් සඳහා උනන්දුවක් දක්වන විදේශීය නියෝජිත කණ්ඩායම් සමඟ සම්බන්ධීකරණ කටයුතු සිදු කරන ලදී.

**7. සංවර්ධන අංශය මගින් ඉදිරිපත් කරන ලද ප්‍රතිපත්තිමය තීරණ සම්බන්ධයෙන් වන අමාත්‍ය මණ්ඩල සංදේශ**

i. 2017 අයවැය යෝජනා ක්‍රියාත්මක කිරීම - විදුලි පාරිභෝගිකයන් තම නිවාස / පරිශ්‍රවල වහල මත ඉදි කරන සූර්ය විදුලි බලාගාර සඳහා ණය පොලී සහන ලබා දීම.
ii. "සූර්ය බල සංග්‍රාමය" වැඩසටහන යටතේ රජයේ ආයතන සඳහා සූර්ය ජනන කට්ටල ලබා දීමේ ව්‍යාපෘතිය.
iii. පුනරීන් ප්‍රදේශයේ මෙ.වො. 240කින් සමන්විත සුළං බල හා මෙ.වො. 800කින් සමන්විත සූර්ය බල දෙමුහුම් විදුලි උත්පාදන උද්‍යානයක් ඉදි කිරීම.
iv. ඉල්ලුම් පාර්ශ්වීය බලශක්ති කළමනාකරණ ජාතික වැඩසටහන යටතේ අඩු විදුලි පරිභෝජනයක් සහිත නිවාස ඒකක වෙත ආලෝක විමෝචන ඩයෝඩ (LED) විදුලි පහන් ලබා දීම.
v. සූර්ය බල විදුලි ජනන ව්‍යාපෘති සඳහා වගා නොකර අත්හැර දමා ඇති කුඹුරු ඉඩම් ලබා ගැනීම.
vi. සූර්ය බල සංග්‍රාමය යටතේ විචල්‍ය මිල විකල්ප මූලධර්මය යටතේ තරගකාරී ටෙන්ඩර් ක්‍රමය මගින් කුඩා පරිමාණ සූර්ය විදුලි බලාගාර පිහිටුවීම - අදියර II
vii. පිවිතුරු බලශක්ති හා ජාල කාර්යක්ෂමතා සංවර්ධන ව්‍යාපෘතිය - ණය අංක 2892 / 2893 (SF) - SRI. අංක 2892 / 2893 (SF) - SRI ණය දීර්ඝ කිරීම සඳහා ඉල්ලුම් කිරීම.

**8. තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පනත යටතේ වන කාර්යයන්**

තොරතුරු දැන ගැනීමේ පනත යටතේ මෙම අමාත්‍යාංශයට අයත් සියලු කාර්යයන් මෙම අංශය මගින් සිදු කෙරේ. 2017 වර්ෂය තුළ දී තොරතුරු ඉල්ලීම් 30ක් ලැබී ඇත. ඉන් ඉල්ලීම් 09ක් සඳහා සම්පූර්ණයෙන් තොරතුරු සපයා ඇති අතර, ඉල්ලීම් 04ක් සඳහා තොරතුරු කොටසක් පමණක් (පනතේ විධිවිධාන අනුව) සපයා ඇත. පනතේ 5වන වගන්තියේ ප්‍රතිපාදන අනුව ඉල්ලීම් 17ක් ප්‍රතික්ෂේප කර ඇත. 2017 වර්ෂය තුළ දී අභියාචනා 04ක් නම් කළ නිලධාරියා වෙත ඉදිරිපත් වූ අතර, ඒ සඳහා අවශ්‍ය පියවර ගන්නා ලදී.

**9. අමාත්‍යාංශයේ වෙබ් අඩවිය යාවත්කාලීන කර පවත්වා ගැනීම හා තොරතුරු තාක්ෂණ කාර්යයන්.**

i. වර්ෂය පුරා නවතම තොරතුරු යාවත්කාලීන කරමින් අමාත්‍යාංශයේ වෙබ් අඩවිය පවත්වා ගෙන ගොස් ඇත. තොරතුරු දැනගැනීම් පනතේ ප්‍රතිපාදන යටතේ තොරතුරු ඇතුළත් කර ඇත.
ii. 2017 තොරතුරු තාක්ෂණ සැලැස්ම සකස් කරන ලදී. අමාත්‍යාංශයේ සියලු තොරතුරු තාක්ෂණ කාර්යයන් මෙම ඒකකය මගින් සිදු කරන ලදී.

**10. සතිපතා ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්වීම.**

ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් සතිපතා ප්‍රගති සමාලෝචන රැස්වීම් සංවිධානය කර පවත්වන ලදී. ප්‍රගති සමාලෝචන රැස්වීමේ තීරණ ක්‍රියාත්මක කිරීමේ පසු විපරම් කටයුතු පවත්වා ගෙන යන ලදී.

# 05. තාක්ෂණ අංශය

## ප්‍රධාන කාර්යයන්

විදුලිබල ක්ෂේත්‍රයේ ප්‍රධාන කාර්යයන් ලෙස අනාගතයේ බලාපොරොත්තු වන ආර්ථික හා කාර්මික සංවර්ධනය හේතුවෙන් වැඩිවෙමින් පවතින විදුලිබල ඉල්ලුම සැපයීම සහ තත්වයෙන් ඉහළ විශ්වසනීය විදුලි සැපයුමක් මහජනතාවට දරාගත හැකි මිලකට ඔවුනට ලබා දීම, පාරම්පරික බලශක්ති ප්‍රභවයන් ප්‍රයෝජනයට ගැනිම, ඉල්ලුම් කළමනාකරණ මැදිහත්වීම් වැනි කාර්යයන් දැක්විය හැකිය. තාක්ෂණ අංශයේ කාර්යභාරය වන්නේ අමාත්‍යාංශය යටතට වැටෙන අදාළ වැඩසටහන් වල ප්‍රතිපත්ති සහ ඒවා ක්‍රියාත්මක කිරිමේ කටයුතු සඳහා අවශ්‍යවන තාක්ෂණික අවශ්‍යතා සහ තාක්ෂණ සහයෝගය ලබා දීමයි.

1. ශ්‍රී ලංකා විදුලිබල පනත යටතේ විධිවිධාන සංශෝධනය කිරිම හා නීති රෙගුලාසි බලාත්මක කිරිම, ප්‍රතිපත්ති මාර්ගෝපදේශ නිකුත් කිරිම, විදුලි අයක්‍රම සකස් කිරිම. විදුලි බලපත්‍ර නිකුත් කිරීම ආදි කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සමඟ සම්බන්ධ වී කටයුතු කිරිම.
2. ලංකා විදුලිබල මණ්ඩලය සම්බන්ධ නීති සම්පාදන කටයුතු සිදු කිරිම.
3. පරමාණුක බලශක්ති මණ්ඩලය, පරමාණුක බලශක්ති නියාමන කොමිෂන් සභාව සම්බන්ධ නීති සම්පාදන කටයුතු සිදු කිරිම.
4. ඉඩම් අත්පත් කරගැනිම හා ව්‍යාපෘති අනුමැතිය හැර සියලු විදුලි උත්පාදන ව්‍යාපෘතිවලට (ජල විදුලිය, න්‍යෂ්ඨික බලය, ගල් අඟුරු සහ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති) අදාළ තාක්ෂණික කරුණු සම්බන්ධ කටයුතු
5. සියලු විදුලිබල හා බලශක්ති සැලසුම් කරන කටයුතු අධීක්ෂණය හා පාලනය කිරිම.
6. බලශක්ති සංරක්ෂණය හා අදාළ තාක්ෂණික කටයුතු.
7. විදුලි උත්පාදන බලාගාරවල ක්‍රියාකාරිත්වයේ අධීක්ෂණය, පාලනය හා සම්බන්ධ තාක්ෂණික කරුණු, බිඳවැටීම් වළක්වා ගැනිම, අවම කිරිම, සම්ප්‍රේෂණ හා බෙදාහැරීම් සම්බන්ධයෙන් ක්‍රියා කිරිම.
8. විදේශ කටයතු අමාත්‍යාංශය සමඟ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අංශයට අදාළ SAARC, BIMSTEC, USAID, ESCAP, IEF වැනි අන්තර්ජාතික සංවිධානය සමඟ ඊට අදාළ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීම.
9. අංශය වෙත අනුයුක්ත නිලධාරීන්ගේ සහ සේවකයන්ගේ පරිපාලනය ඇතුළුව අංශයේ අභ්‍යන්තර පරිපාලනය සිදු කිරිම.
10. ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යතුමා සහ ලේකම් විසින් වරින් වර නියම කරනු ලබන වෙනත් රාජකාරි කටයුතු.

## කාර්ය සාධනය

1. ජාත්‍යන්තර සූර්ය බලශක්ති එකමුතුව ස්ථාපිත කිරිම සම්බන්ධ අමාත්‍ය මණ්ඩල සංදේශ අනුමැතිය පරිදි 64/2017/PE අංක හා 2016.11.17 දින දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය ජාත්‍යන්තර සූර්ය බලශක්ති එකමුතුව සම්බන්ධ රාමුගත ගිවිසුමට අනුව පහත සඳහන් කරුණු සඳහා අනුමැතිය ලබා දෙන ලදි.
   i. ජාත්‍යන්තර සූර්ය බලශක්ති එකමුතුව ස්ථාපිත කිරිම සම්බන්ධ රාමුගත ගිවිසුම අත්සන් කිරිම.

ii. ඉහත රාමුගත ගිවිසුම අත්සන් කිරීම සඳහා ගරු විදේශ කටයුතු අමාත්‍යතුමාට හෝ ශ්‍රී ලංකා රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට බලය ලබා දීම.

iii. ජාත්‍යන්තර සූර්ය බලශක්ති එකමුතුව සඳහා කැමැත්තෙන් කරනු ලබන වාර්ෂික ගෙවීමක් සුදුසු වන්නේ නම්, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සඳහා වෙන් කිරීමට භාණ්ඩාගාර ලේකම්වරයා වෙත බලය ලබාදීම.

2. සූර්යබල සංග්‍රාමය අදියර 2 වශයෙන් විචල්‍ය මිල විකල්ප මූලධර්මය (Variable Price Option) යටතේ තරඟකාරී ටෙන්ඩර් ක්‍රමය මඟින් කුඩා පරිමාණ සූර්ය බලාගාර පිහිටුවීම 2017.04.18 දිනැති අංක 14/2017/PE දරන අමාත්‍ය මණ්ඩල සංදේශයේ පහත සඳහන් සංශෝධන සඳහා 2017.05.02 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.

   i. 9,12,13 වගන්ති ඉවත් කොට පහත සඳහන් වගන්තිය ඇතුළත් කිරීම.

      "සෑම ලංසුකරුවෙකුම රුපියල් මිලියන 2ක ලංසු සුරැකුමක් ඉදිරිපත් කළ යුතු අතර සෑම සාර්ථක ලංසුකරුවෙකුම රුපියල් මිලියන 15 ක කාර්ය සාධන බැඳුම්කරයක් ඉදිරිපත් කළ යුතුය."

   ii. 10 සහ 11 වගන්ති ඉවත් කොට පහත සඳහන් වගන්ති ඇතුළත් කිරීම

      "සාර්ථක ලංසුකරුවන් ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරී පනත යටතේ තාවකාලික අනුමැතිය සහ බලශක්ති බලපත්‍රය ලබාගැනීම සඳහා ඉල්ලුම් කළ යුතු අතර, ඔවුන්ට නොපමාව එම අනුමැතීන් ලබා දී විදුලිය මිලදී ගැනීමේ ගිවිසුම් අත්සන් කිරීමට සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා ලංකා විදුලිබල මණ්ඩලය කටයුතු කරනු ඇත. යම් සාර්ථක ලංසුකරුවකුට සූර්යබල ව්‍යාපෘතියක් සඳහා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සක්‍රිය ලියාපදිංචියක් ඇත්නම්, එම ලියාපදිංචිය අවලංගු කර ඒ සඳහා ගෙවා ඇති ගාස්තු නව ලියාපදිංචිය සඳහා ගෙවිය යුතු ගාස්තු වශයෙන් යොදා ගැනීමට අයදුම්කරුගේ කැමැත්ත පරිදි ඉල්ලුම් කළ හැකිය".

3. බෙංගාල බොක්ක ආශ්‍රිත රටවල් සහ තාක්ෂණික සහයෝගිතාවය සම්බන්ධයෙන් වූ බිම්ස්ටෙක් (BIMSTEC) සංවිධානයේ රටවල්හි විදුලි සම්ප්‍රේෂණ පද්ධති සම්බන්ධ කිරීම පිළිබඳ අවබෝධතා ගිවිසුම අංක 07/2017/PE හා 2017.03.09 දිනැති සංදේශය මඟින් කැබිනට් අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදි. ඒ සඳහා 2017.03.28 වන දින පහත සඳහන් පරිදි අනුමැතිය ලබා දී ඇත.

   i. සංදේශයේ යෝජිත පරිදි සහ ඊට ඇමුණුම - E ලෙස යා කර තිබූ, බිම්ස්ටෙක් (BIMSTEC) රටවල්හි ග්‍රිඩ් අන්තර් සම්බන්ධතාව ස්ථාපිත කිරීම සඳහා වන අවබෝධතා ගිවිසුම අත්සන් තැබීමට හා,

   ii. ශ්‍රී ලංකා රජය වෙනුවෙන් ඉහත සඳහන් අවබෝධතා ගිවිසුමට අත්සන් තැබීම පිණිස විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමා/විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති නියෝජ්‍ය අමාත්‍යතුමා විසින් නම් කරනු ලබන එම අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකුට බලය පැවරීම.

4. එම්/එස් ෆෙයාවේ හෝල්ඩිංස් පුද්ගලික සමාගම සහ කේ.සී.එච්.ටී.ලංකා ජැන්ග් පුද්ගලික සමාගම විසින් තුම්බෝව්ල, කරදියාන සහ මුතුරාජවෙල ප්‍රදේශයන්හි ස්ථාපිත කිරීමට නියමිත නාගරික ඝන අපද්‍රව්‍ය පිරිසැකසුම් කිරීමේ පද්ධතිය පිළිබඳව කරන ලද නිර්දේශය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ඉල්ලීම පිළිබඳ විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යවරයා විසින් 2017.01.09 දින නිරීක්ෂණ ඉදිරිපත් කරන ලද අතර ඒ සඳහා 2017.02.21 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය හිමි විය.

5. විදුලිබලයෙන් ධාවනය කෙරෙන වාහන (විද්‍යුත් මෝටර් රථ) ආරෝපණය කිරීමේ මධ්‍යස්ථාන නියාමනය ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මඟින් ඉදිරිපත් කර ඇති අමාත්‍ය මණ්ඩල සංදේශය 2017.03.24 දින ගරු විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යතුමාගේ නිරීක්ෂණ ඉදිරිපත් කර ඇත. ඒ සඳහා 2017.03.28 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය මඟින් කටයුතු කිරීමට උපදෙස් දී ඇත.

6. ජාත්‍යන්තර පරමාණුක බලශක්ති ඒජන්සියේ ප්‍රසම්පාදන ක්‍රමවේදය තුළින් ශ්‍රී ලංකා පරමාණුක බලශක්ති මණ්ඩලයට අවශ්‍ය විද්‍යාත්මක උපකරණ ප්‍රසම්පාදනය කරගැනීම යන 56/2016/PE අංක හා 2016.12.05 දින දරණ අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2017.01.03 දින අමාත්‍ය මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇති අතර, එම තීරණය ක්‍රියාත්මක කිරීම සඳහා පරමාණුක බලශක්ති මණ්ඩලයට දන්වා සිටින ලදි.

# 06. ටෙන්ඩර් අංශය

## ප්‍රධාන කාර්යයන්

විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ ටෙන්ඩර් අංශයට සියලු ප්‍රසම්පාදන ආශ්‍රිත කාර්යයන් හා එයට අදාළ සියලු කටයුතු කර ගෙන යන ලෙස පවරා ඇත. පහත සඳහන් වනුයේ අංශය මගින් සිදු කරනු ලබන ප්‍රධාන කටයුතුය.

1. අමාත්‍ය මණ්ඩලය පත් කළ ප්‍රසම්පාදන කමිටු වලට අදාළ කටයුතු
2. අමාත්‍ය මණ්ඩලය පත් කළ සාකච්ඡා කමිටු වලට අදාළ කටයුතු
3. අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටු වලට අදාළ කටයුතු
4. අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වලට අදාළ ප්‍රසම්පාදන කටයුතු සඳහා MPC හා SCAPC රැස්වීම් සංවිධානය කිරීම
5. අදාළ ප්‍රසම්පාදන සඳහා අවශ්‍ය අවස්ථාවන්හි දී අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කිරීම
6. ප්‍රසම්පාදන කටයුතු හා අදාළ ප්‍රගති වාර්තා රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම
7. ප්‍රසම්පාදනයන්ට අදාළ අනෙකුත් කටයුතු

## කාර්ය සාධනය

| | |
|---|---|
| 2015 ආරම්භ කොට කරගෙන යනු ලබන MPC ප්‍රසම්පාදන සංඛ්‍යාව | 02 |
| 2016 ආරම්භ කොට කරගෙන යනු ලබන MPC ප්‍රසම්පාදන සංඛ්‍යාව | 05 |
| 2017 වසරේ ආරම්භ කළ MPC ප්‍රසම්පාදන සංඛ්‍යාව | 19 |
| 2017 ප්‍රදානය කළ මුළු MPC ප්‍රසම්පාදන සංඛ්‍යාව | 14 |
| අවලංගු කළ ප්‍රසම්පාදනයන් සංඛ්‍යාව | 00 |

| | |
|---|---|
| 2015 සිට ආරම්භ කොට කරගෙන යනු ලබන CANC/CAPC/SCAPC/SSCAPC සංඛ්‍යා | 10 |
| 2016 සිට ආරම්භ කොට කරගෙන යනු ලබන CANC/CAPC/SCAPC/ SSCAPC සංඛ්‍යා | 08 |
| 2017 වසරේ ආරම්භ කළ CANC/CAPC/SCAPC/ SSCAPC සංඛ්‍යාව | 29 |
| 2017 වසරේ පිරිනමන ලද CANC/CAPC/SCAPC/ SSCAPC සංඛ්‍යාව | 33 |

| | |
|---|---|
| 2017 වර්ෂයේ දී ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශ සංඛ්‍යාව | 33 |

වගු අංක 6.1

| අ.අ. | ගොනු අංකය | කැබිනට් පත්‍රිකා අංකය | දිනය | විස්තරය |
|---|---|---|---|---|
| 1 | PE/TEN/CANC /SS/2016/22 | 01/2017/PE | 20.01.2017 | ඉදිරියේදී ඇතිවිය හැකි වියළි කාලගුණ තත්ත්වයට මුහුණදීම සඳහා දැනට ගිවිසුම් කාලය අවසන් වී ඇති ඇඹිලිපිටිය ACE Power විදුලි බලාගාරය, මාතර ACE Power විදුලි බලාගාරය සහ පුත්තලම හෙලදනව් විදුලි බලාගාරය යන දැවි තෙල් විදුලි බලාගාර වල ගිවිසුම් කාලය වසරකින් දීර්ඝ කිරීම |
| 2 | PE/TEN/ SCAPC/SS/ 2016/83 | 02/2017/PE | 20.01.2017 | හදිසි අවශ්‍යතාවය සඳහා අඛණ්ඩ විදුලි සැපයුමක් සහතික කිරීම සඳහා මෙගාවොට් 60ක අතිරේක විදුලි ධාරිතාවයක් මාස 06 ක කාල සීමාවක් සඳහා මිලදීගැනීමේදී අනුගමනය කරනු ලැබූ ක්‍රියාපටිපාටිය පිළිබඳ අමාත්‍ය මණ්ඩලය දැනුවත් කිරීම |
| 3 | PE/TEN/ SCAPC/SS/ 2015/49-I | 03/2017/PE | 20.02.2017 | හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා ඉහළ නැංවීමේ ආයෝජන වැඩසටහන - ට්‍රාන්ච් 2- පැකේජ 2 - ලොට් B1 - මන්නාරම-නඩුකුඩා 220kV, කි.මී. 30 සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම |
| 4 | PE/TEN/ SCAPC/SS/ 2015/51-II | 04/2017/PE | 26.01.2017 | ආසියානු සංවර්ධන බැංකුවේ ණය ආධාර අංක 2518/2519 SRI, පිවිතුරු බලශක්ති හා ප්‍රවේශතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය යටතේ ඉතිරි අරමුදල් මගින් ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීම් ජාලය වැඩිදියුණු කිරීම සඳහා උපකරණ මිලදීගැනීම<br>Part 3 – Lot E (Sub Lot 1 – Medium Voltage Insulators, Sub Lot 2 – Wooden Poles, Sub Lot 3 – Recloser Auto, Sub Lot 4 – Switches,<br>Sub lot 5 – Switches- Load Break, Air insulated) |
| 5 | PE/TEN/CAPC/ SG/2016/68 | 08/2017/PE | 10.03.2017 | මෙගා වොට් 20ක ධාරිතාවයකින් යුත් සීතාවක ගඟ ජල විදුලි ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු වල විශේෂඥ උපදේශන සේවා කොන්ත්‍රාත්තුව මධ්‍යම ඉංජිනේරු කාර්යයන් පිළිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය (CECB) වෙත ප්‍රදානය කිරීම. |
| 6 | PE/TEN/ SCAPC/SL/ 2016/44 | 09/2017/PE | 24.04.2017 | ලංකා විදුලිබල මණ්ඩලයේ දෙහිවල බෙදාහැරීම් කලාප 04 සඳහා කාර්යාල සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම |
| 7 | PE/TEN/ SSCAPC/SS/ 2016/69 | 11/2017/PE | 10.03.2017 | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ පුත්තලම ගල් අඟුරු බලාගාරය සඳහා හදිසි අවශ්‍යතාවයට<br>හදිසි අවස්ථා මිලදීගැනීම් (Spot Tender) යටතේ අවශ්‍ය ගල් අඟුරු මිලදීගැනීම<br>ක්ෂණික මිලදීගැනීම් - 6 හා ක්ෂණික මිලදීගැනීම් - 7 |
| 8 | PE/TEN/ SCAPC/SS/ 2016/76 | 12/2017/PE | 16.03.2017 | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ පුත්තලම ගල් අඟුරු බලාගාරය සඳහා හදිසි අවශ්‍යතාවයට<br>හදිසි අවස්ථා මිලදීගැනීම් (Spot Tender) යටතේ අවශ්‍ය ගල් අඟුරු මිලදීගැනීම<br>ක්ෂණික මිලදීගැනීම් - 8 |

| | | | | |
|---|---|---|---|---|
| **9** | PE/TEN/ SCAPC/ SS/2015/59 | 13/2017/PE | 23.03.2017 | පිවිතුරු බලශක්ති සහ ජාලගත කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය , මන්නාරම ග්‍රිඩ් උපපොල ඉදි කිරීමේ වැඩ පරාසය සංශෝධනය කිරීම |
| **10** | PE/TEN/ SCAPC/SS/ 2015/65 | 22/2017/PE | 27.04.2017 | ලක්විජය බලාගාරය සඳහා ගල් අඟුරු සැපයීමේ ටෙන්ඩරය ප්‍රදානය කිරීම |
| **11** | PE/TEN/ SCAPC/SG/ 2015/56 | 23/2017/PE | 18.04.2017 | ලක් විජය ගල් අඟුරු බලාගාරයේ මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා සහාය ලබා ගැනීම වෙනුවෙන් China Machinery Engineering Corporation ආයතනයට ගෙවීම් කිරීම. |
| **12** | PE/TEN/ SCAPC/V/2012 /01 | 26/2017/PE | 09.05.2017 | නව හබරණ ග්‍රිඩ් උපපොළ 220kV/132kV / 33kv ඉදිකිරීම සහ වේයන්ගොඩ ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීම - ලොට් A<br>කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම |
| **13** | PE/TEN/ SCPAC/SK/ 2016/31 | 32/2017/PE | 14.07.2017 | කෙරවලපිටිය මෙගා වොට් 300 සංයුක්ත චක්‍රීය ද්විත්ව ඉන්ධන ස්වභාවික වායු විදුලි බලාගාරයට අදාළ ටෙන්ඩරය පිළිබඳ ප්‍රතිපත්තිමය තීරණයක් ගැනීම |
| **14** | PE/TEN/ SCAPC/ SG/2015/54-I | 33/2017/PE | 18.07.2017 | පුනර්ජනනීය බලශක්තිය ලබා ගැනීම සඳහා වූ සම්ප්‍රේෂණ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - (නාවලපිටිය, රාගල, වේවැල්වත්ත හා මාලිබොඩ ග්‍රිඩ් උපපොළ 4 ඉදිකිරීම සඳහා ද්‍රව්‍ය හා භාණ්ඩ මිලදී ගැනීම.)<br>පැකේජ 1 |
| **15** | PE/TEN/ SCAPC/SG/ 2016/77 | 34/2017/PE | 03.07.2017 | ලංකා විදුලිබල මණ්ඩලයේ අනුරාධපුර නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී කාර්යාලය සඳහා කාර්යාල සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම් කොන්ත්‍රාත්තුව පිරිනැමීම |
| **16** | PE/TEN/ SCAPC/ SC/2017/05 | 35/2017/PE | 25.07.2017 | සපුගස්කන්ද විදුලි බලාගාරය සඳහා 2017/2018 වර්ෂයට අවශ්‍ය ලිහිසිතෙල් (Lubricating Oil) මිලදී ගැනිම |
| **17** | PE/TEN/ SCAPC/ SG/2015/54-III | 37/2017/PE | 16.08.2017 | පුනර්ජනනීය බලශක්තිය ලබා ගැනීම සඳහා වූ සම්ප්‍රේෂණ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය - (නාවලපිටිය, රාගල, වේවැල්වත්ත හා මාලිබොඩ ග්‍රිඩ් උපපොළ 4 ඉදිකිරීම.)<br>පැකේජ III |
| **18** | PE/TEN/ SCAPC/SS/ 2015/49 | 39/2017/PE | 18.08.2017 | හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා ඉහළ නැංවීමේ ආයෝජන වැඩසටහන -<br>ට්‍රාන්ච් II, පැකේජ 2 - ලොට් A - මන්නාරම-නඩුකුඩා 220/33kV, සම්ප්‍රේෂණ මාර්ගය ඉදිකිරීම<br>පැකේජ 2 - ලොට් A - නඩුකුඩා 220/33kV ග්‍රිඩ් උපපොළ ඉදිකිරීම, මන්නාරම 220/33kV ග්‍රිඩ් උපපොළ වැඩිදියුණු කිරීම කොන්ත්‍රාත්තුව පිරිනැමීම |
| **19** | PE/TEN/ SCAPC/SL/ 2016/39 | 43/2017/PE | 28.08.2017 | පුත්තලම ලක්විජය බලාගාරයේ II අදියර යටතේ වික්ටෝරියා වතුයායේ පාරවල්, බෝක්කු සහ වීදි විදුලිපහන් ඉදිකිරීමේ ටෙන්ඩර් ප්‍රදානය කිරීම |

| | | | | |
|---|---|---|---|---|
| 20 | PE/TEN/ SCAPC/SL/ 2016/75 | 46/2017/PE | 16.08.2017 | ඒරියල් බණ්ඩල් සන්නායක (ABC) 3× 70 + 54.6 sqmm – 700km සැපයීම හා බෙදාහැරීම සඳහා කොන්ත්‍රාත්තුව පිරිනැමීම |
| 21 | PE/TEN/ SCAPC/SS/ 2015/65 | 50/2017/PE | 29.09.2017 | ලක්විජය බලාගාරය මෙගාවොට් 900 සඳහා ගල් අඟුරු සැපයීමේ ටෙන්ඩරය ප්‍රදානය කිරීම |
| 22 | PE/TEN/ SCAPC/SG/ 2016/50 | 51/2017/PE | 29.09.2017 | ලංකා විදුලිබල මණ්ඩලයේ බෙදාහැරීම් කලාප දෙක සඳහා කෘෂ කැබ් රථ මිලදී ගැනීම හා බෙදාහැරීම ටෙන්ඩර් ප්‍රදානය කිරීම. |
| 23 | PE/TEN/ SCAPC/SH/ 2017/13 | 52/2017/PE | 29.09.2017 | බත්තල් මත ඉදිකරන ලද තාප විදුලි බලාගාරය සඳහා 2017/2018 වර්ෂයට අවශ්‍ය සිලින්ඩර් ලිහිසි තෙල් සහ සිස්ටම් ලිහිසි තෙල් සැපයීම සහ බෙදා හැරීම ටෙන්ඩරය ප්‍රදානය කිරීම |
| 24 | PE/TEN/ SSCAPC/SP/ 2017/31 | 53/2017/PE | 21.09.2017 | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ පුත්තලම ගල් අඟුරු බලාගාරය සඳහා හදිසි අවශ්‍යතාවයට<br>හදිසි අවස්ථා මිලදීගැනීම් (Spot Tender) යටතේ අවශ්‍ය ගල් අඟුරු මිලදීගැනීම<br>ක්ෂණික මිලදීගැනීම් - 9 |
| 25 | PE/TEN/ SCAPC/SK/ 2016/47 | 55/2017/PE | 16.10.2017 | කන්ටේනර්හි ඇසුරුම්කළ 1MW/1.25 මෙගාවොට් ඩීසල් ජෙනරේටර් 50 ක්, කන්ටේනර්හි ඇසුරුම් කළ ට්‍රාන්ස්පෝමර් ඒකක 25 ක් හා කන්ටේනර්හි ඇසුරුම් කළ ඩීසල් ඉන්ධන ටැංකි 25 ක් ප්‍රවාහනය කොට සවිකිරීම සඳහා ටෙන්ඩරය ප්‍රදානය කිරීම |
| 26 | PE/TEN/ SCAPC/SP/ 2017/45 | 58/2017/PE | 23.10.2017 | අමාත්‍ය මණ්ඩලය විසින් පත්කරන ලද විශේෂ ස්ථාවර ප්‍රසම්පාදන කමිටු අනුමැතිය යටතේ පුත්තලම ගල් අඟුරු බලාගාරය සඳහා හදිසි අවශ්‍යතාවයට<br>හදිසි අවස්ථා මිලදීගැනීම් (Spot Tender) යටතේ අවශ්‍ය ගල් අඟුරු මිලදීගැනීම<br>ක්ෂණික මිලදීගැනීම් - 10 |
| 27 | PE/TEN/ SCAPC/SG/ 2016/66 | 61/2017/PE | 27.10.2017 | පුත්තලම මෙගා වොට් 900 බලාගාරයේ අතුරුඵලයන් ලෙස නිපදවෙන අළු බැහැරලීම සඳහා ටෙන්ඩර් ප්‍රදානය කිරීම. |
| 28 | PE/TEN/ SCAPC/SC/ 2017/05 | 60/2017/PE | 31.10.2017 | විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සහ ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශය ඉදිරිපත් කරන ඒකාබද්ධ අමාත්‍ය මණ්ඩල සංදේශය<br>සපුගස්කන්ද විදුලි බලාගාරය සඳහා 2017/2018 වර්ෂයට අවශ්‍ය ලිහිසි තෙල් මිල දී ගැනීම ටෙන්ඩරය ප්‍රදානය කිරීම. |
| 29 | PE/TEN/ SCAPC/SC/ 2017/29 | 65/2017/PE | 20.11.2017 | සූර්ය බල සංග්‍රාමය වැඩසටහන යටතේ රාජ්‍ය ආයතන සඳහා සූර්ය බල පද්ධති ලබාදීම.<br>ටෙන්ඩර් ප්‍රදානය කිරීම. |
| 30 | PE/TEN/ SCAPC/ SG/2015/54-II | 70/2017/PE | 21.11.2017 | පුනර්ජනනීය බලශක්තිය ලබා ගැනීම සඳහා වූ සම්ප්‍රේෂණ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය (නාවලපිටිය, |

| | | | | |
|---|---|---|---|---|
| | | | | රාගල, වේවැල්වත්ත හා මාලිබොඩ ග්‍රිඩ් උපපොළ 4 ඉදිකිරීම).<br>පැකේජ II<br>Lot A: Design, Supply, Delivery, Installation and Commissioning of Protection,Control, Metering and Substation Automation System<br>Lot B: Design, Supply & Delivery of Steel structures, Gantries, Busbars, Conductors, Post Insulators & Insulator strings, Connectors and Connecting Accessories |
| **31** | PE/TEN/ SCAPC/SC/ 2017/15 | 71/2017/PE | 05.12.2017 | ලක් විජය බලාගාරයේ ඒකක 02 හි ටර්බයිනය සහ අදාළ ප්‍රධාන උපාංගවල Level "B" නඩත්තු කටයුතු සඳහා විශේෂඥ මිනිස් බල සේවා ලබා ගැනීම සඳහා කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම. |
| **32** | PE/TEN/ SCAPC/SG/ 2017/03 | 72/2017/PE | 07.12.2017 | සූර්ය බල සංග්‍රාමය අදියර II වැඩසටහන යටතේ තරගකාරී ලංසු කැඳවා විවෘත මිල ගණන් යටතේ කුඩා පරිමාණ සූර්ය බල විදුලි බලාගාර 1MW X 60 පිහිටුවීම සඳහා කොන්ත්‍රාත්තු පිරිනැමීම. |
| **33** | PE/TEN/ SCAPC/ SL/2016/55 | 73/2017/PE | 26.12.2017 | ලක්විජය බලාගාරයේ ගල් අඟුරු අංගනය හා අළු අංගනය වටා සුළං ආවරණයක් ඉදි කිරීම කොන්ත්‍රාත් ප්‍රදානය කිරීම |

වගු අංක 6.2

# 07. පාලන අංශය

මානව හා භෞතික සම්පත් නිසි ලෙස කළමනාකරණය කරමින් ක්‍රියාකාරි සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ඉලක්ක සපුරා ගැනිම සඳහා පාලන අංශය පහත පරිදි ක්‍රියාත්මක වී තිබේ.

## ප්‍රධාන කාර්යයන්

ඵලදායි පරිපාලන ක්‍රමෝපායන් භාවිත කරමින්, අමාත්‍යාංශයේ සමස්ත පරිපාලනය සම්බන්ධයෙන් සහ පරිපාලනයට අදාළව අමාත්‍යාංශයේ විවිධ අංශ අතර හා විෂය පථයට අයත් වන අනෙකුත් ආයතන වෙත අධීක්ෂණය ලබා දීම හා සම්බන්ධිකරණයක් පවත්වා ගනිමින් අමාත්‍යාංශයේ ඉලක්ක සපුරා ගැනිම සඳහා සහාය වීම පාලන අංශයේ වගකීම වේ.

## කාර්ය සාධනය

### 1. පෞද්ගලික ලිපිගොනු නඩත්තු කිරීම

ඉහත සඳහන් පරිදි මානව සම්පත් කළමනාකරණය කාර්යක්ෂමව කිරිම සඳහා අමාත්‍යාංශයේ නිලධාරින්ගේ පෞද්ගලික ලිපි ගොනු නිසි පරිදි යාවත්කාලීන කර ඇත. එබැවින් වැටුප් ප්‍රතිශෝධන, වාර්ෂික වැටුප් වර්ධක, කාර්යක්ෂමතා කඩඉම් සහ උසස් වීම් නිසි කලට ලබා දීමට හැකි වී තිබේ. ස්ථාන මාරුවීම් ලබා ගිය නිලධාරින්ගේ යාවත්කාලින කළ පෞද්ගලික ලිපි ගොනු කෙටි කාලයක් තුළ අදාළ කාර්යාල වෙත යැවීමට කටයුතු කර තිබේ.

අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාවට අදාළව තත්‍ය තොරතුරු මත අදාල දත්ත පද්ධතිය නිරන්තරයෙන් යාවත්කාලීන කරනු ලබයි. එමඟින් ඒ ඒ තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා අදාල කටයුතු කිරිම පහසු වී තිබේ.

### 2. මානව සම්පත් සංවර්ධනය

2017 වර්ෂය තුළදී, අමාත්‍යාංශය විසින් දේශීය හා විදේශීය, පුහුණු හා පර්යේෂණ වැඩසටහන් හා සම්මන්ත්‍රණ සඳහා නිලධාරින් යොමු කිරිම සඳහා පහසුකම් සලසන ලද අතර අමාත්‍යාංශ නිලධාරීන්, (ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය) ආදි අමාත්‍යාංශය යටතට ගැනෙන ආයතනවල නිලධාරින් හට තම විෂය දැනුම හා කුසලතා වැඩිදියුණු කර ගැනීමට හැකි වී ඇත. තම එදිනෙදා රාජකාරි කටයුතු, පහසුවෙන් හා විධිමත් ආකාරයෙන් ඉටු කර ගැනීමට ඔවුනට එම පුහුණු හා අත්දැකිම් ප්‍රයෝජනවත් වී තිබේ.

**විදේශීය පුහුණු**

| අ.අ | වැඩසටහන | රට | කාලසීමාව | සහභාගිත්වය | |
|---|---|---|---|---|---|
| | | | | නම | තනතුර |
| 1 | High Level Panel Discussion on Opportunities and challenges of Energy System transformation 17th January 2017 | තායිලන්තය | 17 ජනවාරි 2017 | අජිත් පී පෙරේරා මහතා | ගරු නියෝජ්‍ය අමාත්‍ය |
| 2 | 2017 Policy Dialogue on Energy for Sustainable Development in Asia and the pacific | තායිලන්තය | 17-19 ජනවාරි 2017 | එම්.ජී.ඒ.ගුණතිලක මහතා | අතිරේක ලේකම් (තාක්ෂණ) |
| 3 | Capacity Building Programme on Successful project Design and Implementation | පිලිපිනය | 13-15 පෙබරවාරි 2017 | කේ.වී.අයි.මල්ලිකා මිය | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් (ටෙන්ඩර්) |
| 4 | KGGP Korea Green Knowledge Exchange Study Tour Focused on VER Integration | දකුණු කොරියාව | 13-17 පෙබරවාරි 2017 | අජිත් පී පෙරේරා මහතා<br>ජේ.ජී.එල්.එස්.ජයවර්ධන මහතා | ගරු නියෝජ්‍ය අමාත්‍ය<br>අධ්‍යක්ෂ (සංවර්ධන) |
| 5 | Bilateral Discussion | මියන්මාරය | 28 පෙබරවාරි 2017 | ආචාර්ය බී.එම්.එස්.බටගොඩ මහතා | ලේකම් |
| 6 | Development of innovator Energy Technologies and solution | ජපානය | 01-03 මාර්තු 2017 | කේ.ජී.සී.ජයසේකර මහතා | අධ්‍යක්ෂ (තාක්ෂණ) |
| 7 | Invitation to 05th south Asia power secretaries Round Table Renewable Energy Rural Electricity Access | තායිලන්තය | 05-06 මාර්තු 2017 | ආචාර්ය බී.එම්.එස්.බටගොඩ මහතා | ලේකම් |
| 8 | 03rd Edition of International Conference and Exhibition - India Smart Grid week | ඉන්දියාව | 07-10 මාර්තු 2017 | එස්.ඒ.එන්.සරණතිස්ස මහතා | අතිරේක ලේකම් (පාලන හා ප්‍රසම්පාදන) |
| 9 | 2017 Seminar on Energy Strategy For "The Belt and Road "Countries | චීනය | 29 මාර්තු -12 අප්‍රේල් 2017 | එරංගි ප්‍රනාන්දු මිය | සහකාර ලේකම් (පාලන) |
| 10 | LNG Study Tour | පාකිස්ථානය | 23 -28 අප්‍රේල් 2017 | ඩී.ඩී.අමරතුංග මහතා | අතිරේක ලේකම් (විදුලිබල හා බලශක්ති) |
| 11 | Short Course in Supporting Energy Security in South Asia | ඔස්ට්‍රේලියාව | 01-19 මැයි 2017 | කේ.එල්.ආර්.සී.විජේසිංහ මහතා | අධ්‍යක්ෂ (විදුලිබල හා බලශක්ති) |
| 12 | Short course on Management & Negotiation Skill Development | ඔස්ට්‍රේලියාව | 15 - 26 මැයි 2017 | එස්.කේ. මලවිසූරිය මහතා | ප්‍රධාන අභ්‍යන්තර විගණක |
